# 2013 ජූලි 03 වැනි දින දී මහරගම යොවුන් රඟහලේ පැවැත්වූ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ 70 වන සංවත්සරයේ දී, පක්ෂයේ ප්‍රධාන ලේකම් ඩිව් ගුණසේකර සහෝදරයා

## පැවැත්වූ දේශනය

ප්‍රිය සහෝදරවරුනි, මිත්‍රවරුණි,

අද ජූලි 03 දින අපේ පක්ෂයේ උපන් දිනයයි. ඒ නිමිත්තෙන් අද අප පවත්වන්නේ පක්ෂයේ 70 වන සංවත්සරයයි. මේ වසරේ, වමේ ව්‍යාපාරයේ ප්‍රභවය වශයෙන් සලකනු ලබන අධිරාජ්‍ය විරෝධී සූරියමල් ව්‍යාපාරයේ 80 වන සංවත්සරය ද මේ වසරට යෙදී තිබෙනවා.

70 වසරක් යනු මිනිසාගේ ජීවිතයේ ප්‍රමාණවත් කාලයක් වුවද, දේශපාලන ව්‍යාපාරයක විශේෂයෙන් ම සමාජ ක්‍රමයක් වෙනස් කරලීම සඳහා වූ දීර්ඝ කාලීන අරමුණු ඇති ව්‍යාපාරයක වසර 70 ක්, ඉතිහාසයේ කෙටි කාලයකි.

අපේ පක්ෂය පිහිටුවනු ලැබුවේ යටත් විජිත යුගයේදී යි. 1943 දී නිල වශයෙන් එය පිහිටුවනු ලැබුවද, එහි මුල් ආරම්භය 1930 ගණන් දක්වා ඈතට දිවයනවා. සමාජවාදී පක්ෂයක අවශ්‍යතාවයක් ගැන සිතූ අපේ ව්‍යාපාරයේ පූරෝගාමී නායකයෝ, එදා පූර්ණ නිදහස සඳහා වූ අරගලය හරහා, විවිධ අවධීන් තුළිනුයි එය ක්‍රමානුකූලව ගොඩ නැගුවේ.

කොළඹ තරුණ සංගමය (1929), සමස්ත ලංකා තරුණ සම්මේලනය (1931), සූරිය මල් ව්‍යාපාරය (1933) ලංකා සමසමාජ පක්ෂය (1935), කොළඹ කම්කරු සමාජය (1940), සමාජවාදී එක්සත් පක්ෂය (1940) සහ ලංකා කොමියුනිස්ට් පක්ෂය (1943) එම අවධීන් ය.

මුල සිට ම වාගේ සම්බන්ධ වූ නායක මට්ටමේ පුරෝගාමීන් පස් දෙනෙකි. දොස්තර එස්.ඒ.වික්‍රමසිංහ, පීටර් කෙනමන්, එම්.ජී.මෙන්ඩිස් පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි සහ ඒ.වෛද්‍යලිංගම් මේ අවස්ථාවේ දී අපි ඔවුන් කෘතවේදී ව සිහිපත් කරනවා. ඔවුන් අපේ පක්ෂයට චින්තනය, දැක්ම, ශක්තිය, පන්නරය, සටන්කාමිත්වය සහ ශික්ෂණය ලබා දුන්නා.

අප පක්ෂයේ 70 වන සංවත්සරය පවත්වනු ලබන අවස්ථාවේ සූරිය මල් ව්‍යාපාරයේ සහ ලංකා සමසමාජ පක්ෂයේ ආරම්භක නායකයින් - ආචාර්ය එන්.එම්.පෙරේරා, පිලිප් ගුණවර්ධන, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන, ඇතුළු සහෝදරුවන් ද, අප ඉමහත් ගෞරවයෙන් හා කෘතවේදීව සිහිපත් කිරීම අප පක්ෂයේ සම්ප්‍රදායයි.

වමේ ව්‍යාපාරයේ ආරම්භක නායක සහෝදරවරුන්ගේ සහෝදර සබඳතා හා මිත්‍රත්වය ශිෂ්‍ය කාලය දක්වා දිවයනවා. කොළඹ දී මෙන්ම ලන්ඩනයේදී ඔවුන් තුළ දේශප්‍රේමිත්වය සහ ජාත්‍යන්තරවාදය පිළිබඳ හැඟීම් පෝෂණය වූයේ අධිරාජ්‍ය විරෝධී අරගලය හරහායි. පූර්ණ

නිදහස, කම්කරු අරගල, මැලේරියා මර්දන ව්‍යාපාරය, සූරියමල් ව්‍යාපාරය, මෙන්ම වැඩවසම් ක්‍රමය-යටත් විජිතවාදය සහ කොම්ප්‍රදෝරු ධනවාදයට එරෙහි අරගල තුළිනි.

ඉකුත් වසර 70 තුළ, සහෝදරවරු ගණනාවක් තම ජීවිත පූජාකළහ. තවත් අය සිරගෙවල් වල දඬුවම් විඳිමින් හා විවිධාකාර හිරිහැර, මර්දනයන්ට ලක්වෙමින් ක්‍රියා කළහ. දැනට අප අතර නැති මෙන්ම අප අතර තවමත් සිටින ඒ සියලු සහෝදරවරුන් පක්ෂය වෙනුවෙන් තම හැකියාවන්, ශ්‍රමය, ධනය වැය කළහ. ඔවුන් සියලු දෙනාම අපි කෘතවේදීව සිහිපත් කරමු.

විශේෂයෙන්ම, දීර්ඝ කාලයක් සිරගතවූ, දොස්තර එස්.ඒ.වික්‍රමසිංහ, පූජ්‍ය උඩකැන්දවල සිරිසරණංකර හිමි, එම්.ජී.මෙන්ඩිස්, වී.ඒ.සමරවික්‍රම, ඩී.පී.යසෝදියස්, ඩබ්ලිව්.එස්. ද සිල්වා යන සහෝදරවරුන් ගැන  සඳහන් කළ යුතුයි.

අපේ පක්ෂය නීත්‍යානුකූල මෙන්ම නීති විරෝධී තත්වයන් යටතේ ක්‍රියාකොට තිබේ. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ වසර 47ක් ද, ආණ්ඩු පක්ෂයේ සන්ධාන ආණ්ඩු තුනක් යටතේ වසර 23 ක් ද, කටයුතු කර ඇත්තෙමු.

අපේ පක්ෂය, පරාජයන්, පසුබැසීම්, තහනම් කිරීම් වලට ලක්වී තිබේ. එමනේම, විවිධාකාරයේ බොරු චෝදනා, අවලාද, පහරදීම්, ඝාතනවලට ද ලක්විය. අප පක්ෂය වැරදි සිදු නොවූ පක්ෂයක් නොවේ. සිදුවූ වැරදි පිළිගත්, ඒවා නිවැරදි කරගත්, ඒවා ජනතාව ඉදිරියේ විවෘතව පිළිගත් පක්ෂයකි. ඒ සඳහා අපට අභ්‍යන්තර ශක්තියක් තිබිණි. අපේ පක්ෂය ස්වයං විවේචනය ගුරුකොට ගත් පක්ෂයකි. උපක්‍රම වලදී මෙන්ම ඇතැම් අවස්ථාවල උපාය මාර්ගයේ දී අප අතින් වැරදි සිදුවී තිබේ. එහෙත්, අප කවදාකවත් ත්‍රස්තවාදය වැළඳගත් පක්ෂයක් නොවේ. අපේ අත්වල ලේ තැවරී නැත. දේශපාලන වාසි නොතකා, අප ප්‍රතිපත්තිමය දේශපාලනයේ නිරතවූ පක්ෂයකි.

අප කෙදිනකවත් ජාතිවාදයට දායකවූ පක්ෂයක් නොවේ. ඉතිහාසය පුරාම ප්‍රචණ්ඩත්වය, ත්‍රස්තවාදය සහ අරාජිකවාදය පිළිකුල් කළ පක්ෂයකි.

ජාතික ප්‍රශ්නය පිළිබඳව අපගත් ස්ථාවරය නිවැරදි බව ජීවිතය, ඉතිහාසය විසින් ඔප්පු කොට ඇත. බොහෝ පක්ෂ අප දරණ ස්ථාවරයට ප්‍රමාදවී හෝ පැමිණ තිබීම ගැන අපි සතුටු වෙමු. පක්ෂයේ ප්‍රතිපත්තිමය ස්ථාවරය රැකගන්නට ගොස් නායක මට්ටමේ සහෝදරවරුන් ගණනාවකගේ (උතුරේ මෙන්ම දකුණේ) වටිනා ජීවිත ගණනාවක් පූජා කිරීමට සිදුවූ බව අප සිහිපත් කළ යුතුය.

අපේ රටේ සමාජ සංවර්ධනයේදී වමේ සෙසු සහෝදර පක්ෂ සමග වෙන් වෙන් වශයෙන් මෙන්ම, සාමූහිකව දායකවී තිබෙනවා. අපේම ආණ්ඩුවක් අප නොපිහිටුවද, විපක්ෂයේ සිටිමන් හා සන්ධාන ආණ්ඩුවල කොටස්කරුවන් වශයෙන් අපේ දැනුම, බුද්ධිමය අත්දැකීම්, හැකියාව, චින්තනය, සංකල්පයන් රටේ පොදු යහපත සඳහා දායාද කොට ඇත. අද ශ්‍රී

ලංකිකයින් වශයෙන් රටේ සාක්ෂරතාවය, අධ්‍යාපන මට්ටම, සෞඛ්‍ය සේවා සහ සමාජ සුරක්ෂිතතාවය ගැන අපි අද ආඩම්බරවෙමු. අපි අසල්වැසි රටවලට වඩා ඒ අංශවලින් ඉදිරියෙන් සිටිමු. එය සිදුවූයේ කෙසේ ද? රාජ්‍ය මන්ත්‍ර සභා දෙකේ සහ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවල පිටු පෙරලුවහොත් ඊට පිළිතුරු සොයා ගත හැකියි. ඒ අපේ වමේ ව්‍යාපාරයේ නායකයින්ගේ බුද්ධිමය දායකත්වයයි-සමාජ චින්තනයට වූ දායකත්වයයි.

1930 ගණන්වල සිට, මෙරට කම්කරු පන්තියට,ගොවි ජනතාවට, රජයේ සේවකයින්ට, ගුරුවරුන්, කාන්තාවන්, තරුණයින්, ශිෂ්‍යයින් හා දරුවන්ගේ අයිතීන් බොහෝ සේ ලබා දී ඇත්තෙමු. ඒ අරගල තුළිනි. අප පාසැල් සිසුන්ගේ හැකියාවන් මොට්ට කළේ නැත. විකෘති කළේ නැත. අපි ඔවුන්ගේ බුද්ධි මහිමය දියුණු කළෙමු. විශ්ව විද්‍යාල උගතුන් බිහි කරන මධ්‍යස්ථාන විය. අද මෙන් ඒවා ත්‍රස්තවාදයට, මුදල් කොල්ල කෑමට, දූෂණයට ගොදුරුවීමට අපේ ශිෂ්‍යයන් ඉඩ නොදුන්හ. දේශප්‍රේමීත්වය සහ ජාත්‍යන්තරවාදය එකම කාසියේ දෙපැත්ත වශයෙන් සලකා අපේ ජනතාව තුළ ඒ පිළිබඳ හැඟීම් හා අවබෝධය වර්ධනය කරලීමට කටයුතු කළෙමු. අද ලොවේ සෙසු ජනතාවගේ අරගලවලදී අපේ රටේ ජනතාව සිය සහෝදරත්වය හා සහයෝගතාවය ප්‍රකාශ කරන්නේ එසේ ලබා ගත් අවබෝධය සහ පන්නරය නිසා ය.
සමාජවාදී රටවල ජනතාව සහ අපේ ජනතාව අතර සබඳතා වර්ධනය කරලීමට අප ඉටු කළ මෙහෙය ගැන අපි ආඩම්බරවෙමු.

ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී සංකල්ප, ප්‍රතිපත්ති සහ නීතිමය වශයෙන් දායකවී තිබෙනවා. විශේෂයෙන්ම, කාර්මිකරකණය, කෘෂිකර්ම නවීකරණය, වාරි මාර්ග, බහුවිධ යෝජනා ක්‍රම, පරිසරය, අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස ආදී විෂයන් සම්බන්ධයෙන් ප්‍රබලව අප දායක වී තිබෙනවා.

අපේ පක්ෂයේ අභිමානවත් ඉතිහාසය තුළ ත්‍රස්තවාදය හා ප්‍රචණ්ඩත්වය දැකිය නොහැකිය. අපේ අත්වල ලේ නැතැයි කියා සිටියේ ඒ නිසයි. එය කොමියුනිස්ට්වරුන්ගේ, මාක්ස්වාදීන්ගේ ක්‍රමවේදය නොවේ. ජාතික විමුක්ති ව්‍යාපාරයේ සන්නද්ධ අරගලවලදී පවා, සටනේදී මිය ගියහොත් මිස, සතුරෙකු වුවද ඝාතනය කිරීම තහනම් ය. හිංසා කිරීම තහනම්ය. හොඳම ආදර්ශය වියට්නාම් හා කියුබානු දේශප්‍රේමී අරගලයි. කොමියුනිස්ට්වරුන්ට අවශ්‍ය මිනිසුන් ජීවත්කරවීම මිස මරාදැමීම නොවේ. කොමියුනිස්ට්වරුන් ලොවේ උත්තරීතර මානවවාදීන් වන හෙයිනි.

දාෂ්ඨිමය ක්ෂේත්‍රය තුළ, කොමියුනිස්ට් විරෝධයට එරෙහිව දැවැන්ත සටනක යෙදීමට අපට සිදුවිය. සමාජය වැළැඳ ගෙන තිබූ මිත්‍යා මත, අද්භූත විශ්වාස, හනමිටි අදහස් වලට එරෙහිවත්, තරුණ පරම්පරාව තුළ විද්‍යාත්මක ලෝක දැක්මක් ඇති කරලීම සඳහාත් අපේ ව්‍යාපාරයේ ආරම්භයේ සිටම ක්‍රියා කරන්නට සිදුවිය. ඒ සඳහා ප්‍රගතිශීලී අදහස් ප්‍රචලිත කරලීම සඳහා පුවත්පත්, සඟරා පලකිරීමට සිදුවිය. මෙහිදී අති විශාල මෙහෙයක් ඉටු කළ සහෝදර සහෝදරියන් රාශියකි. පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර, පීටර් කේනමන්, හේඩි

කේනමන්, කේ.රාමනාදන්, ඊ.එස්.රත්නවීර, ප්‍රේමලාල් කුමාරසිරි, හැරී අබේගුණවර්ධන, එන්.ශන්මුගදාසන්, එච්.පී.එස්.රත්නවීර, නිමල් කරුණාතිලක, හේම ද සිල්වා, බී.ඒ.සිරිවර්ධන, සුරත් අම්බන්ගොඩ, එච්.එම්.පී.මොහිඩීන්, පී.මලල්ගොඩ, පී.රාමනාදන්, එස්.කන්දස්වාමි, බැසිල් පෙරේරා, මෝඩ් කෙනමන්, ඒ.ඒ.ලතීෆ් අප අතර අද නැති ඒ සියලු දෙනා ගෞරවයෙන් සිහිපත් කරමු.

ඒ කර්තව්‍යයේදී අපේ සමහර කතුවරුවන් හා ප්‍රකාශකයින්ට වසර 1 - 5 දක්වා බරපතල වැඩ ඇතිව සිරබත් කන්නට සිදුවුවා. දොස්තර එස්.ඒ.වික්‍රමසිංහ, පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර, බෙනට් සිල්වා, ඩී.පී.යසෝදිස් පළමුවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (3) + වගන්තිය යටතේ දොස්තර වික්‍රමසිංහයන්ගේ ඡන්ද බලය ද ඉවත් කරනු ලැබුවා. 1947 මහා මැතිවරණයට තරඟ කිරීම වලක්වාලීමට අතීතයේ සිට බලපාන අන්දමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඒ වගන්ති ඇතුළත් කළා. ඉතිහාසයේ සිරබත් කෑ පළමු මාධ්‍යවේදීයාත්, ප්‍රකාශකයින් දෙදෙනාත් අපේ පක්ෂයේ සාමාජිකයින්.

අපේ පක්ෂයේ ජාතික සම්මේලන අපේ ව්‍යාපාරයේ මෙන්ම රටේ ඉතිහාසයෙත් ජය ස්ථම්භයන්. ඒ සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කිරීමට වේලාවක් නැහැ.

පක්ෂයේ දෙවන ජාතික සම්මේලනයේදී ස්වාධීනත්වය සම්පූර්ණ කරලීමට හා ජාතික නිදහස තහවුරු කරලීමට අප ප්‍රජාතන්ත්‍රවාදී ජාතික පෙරමුණක් අවශ්‍ය කියා සිටියා. 1950 සතරවන ජාතික සමුළුව, ශ්‍රී ලංකාවේ විප්ලවයේ අවධිය, පුළුල් ප්‍රගතිශීලී පෙරමුණක අවශ්‍යතාවය, ඊට හවුල් කර ගත යුතු සමාජ බලවේගයන් හඳුනාගත්තා. එදා පුළුල් සන්ධානයක් යනු වමේ ව්‍යාපාරයට ගෝචරවූ දෙයක් නෙවෙයි. එහෙත් අප ඒ ඓතිහාසික කාර්යභාරය සඳහා තියුණු දෘෂ්ඨිමය අරගලයක් ගෙන ගියා. අපේ පක්ෂය තුළම වමේ නිකායවාදයට එරෙහි අභ්‍යන්තර අරගලයන් ගෙන ගියා. සමාජ සංවර්ධනය නැත්නම් ඉදිරිගමන සඳහා ඓතිහාසික අවශ්‍යතාවයන් වශයෙන් පිහිටුවනු ලැබූ සියලු වර්ගවල පෙරමුණු ආණ්ඩු එම දෘෂ්ඨිමය අරගලයේ පැහැදිලි ප්‍රතිඵලයන් ය.
1947 මහා මැතිවරණය අවසන් වූ වහාම පවා. එවැනි ප්‍රගතිශීලී ආණ්ඩුවක් පිහිටුවීමට උත්සාහයක් දැරුවා. එදා ශ්‍රී නිශ්ශංකයන්ගේ නිවසේ පැවැති ඓතිහාසික 'යමුනා' සම්මේලනය එවැනි අභිම් වූ අවස්ථාවක්. එය සාර්ථක වූවා නම් නිදහසින් පසු පළමුවන ආණ්ඩුව ප්‍රගතිශීලී ආණ්ඩුවක් වන්නට තිබුණා. 1956 දී ලබාගත් ජනතා ජයග්‍රහණ 1947 දී ලබාගන්නට හැකියාව තිබිණි. අප මුහුණ දෙන ජාතික ගැටළු මගහරවා ගන්නට තිබුණා. ශ්‍රී ලාංකීය ජාතිය ගොඩනැගීම 1947දී පටන් ගන්නට තිබුණා. කම්කරු පන්තිය පැත්තෙන් ගත් කළ, අද ඔවුන් භුක්ති විඳින සියලු අයිතීන් හා වරප්‍රසාද අප අරගල තුළින් ලබාදුන් ඒවායි. විශේෂයෙන් ම විශ්‍රාම වැටුප් සහ අර්ථ සාධක අරමුදල් ආදිය වශයෙන් අප අද පමණක් නොව සැමදා ජාතික සමගිය වෙනුවෙන් සටන් කළ අයයි. වර්ගවාදයට, ජාතිවාදයට, මූලධර්මවාදයට, සියලු ආකාරයේ බෙදීමේ ප්‍රවණතාවයන්ට එරෙහිව සටන් කළා. මේ ප්‍රවණතා දැන් වෘත්තීය සමිති ව්‍යාපාරය තුළට රිංගා තිබෙනවා. මෙම අභියෝගයන්ට අප මුහුණ දිය යුතුයි.

පශ්චාත් නව ලිබරල් යුගයේ, අළුත් ප්‍රපංචයක් එන්.ජී.ඕ. තුළින් මතුවී තිබෙනවා. වෘත්තීය සමිති ව්‍යාපාරයේ සහ වමේ ව්‍යාපාරයේ කාඩර්වරුන් ඩැහැගැනීමේ කුමන්ත්‍රණයක්, විදේශ රටවලින් ගලා එන්නාවූ අරමුදල් වලින්, ඉතා සූක්ෂම ආකාරයට සටන්කාමී වෘත්තීය ව්‍යාපාරය මෙන්ම වමේ ව්‍යාපාරය දුර්වල කිරීමේ යටි අරමුණෙන් මෙය බහු ජාතික සමාගම්වල වුවමනාවක් එය ශ්‍රී ලංකාවේ අපට වදයක්, හිරිහැරයක්, ඉන්දියාව වැනි රටවලට එය තර්ජනයක්.

කම්කරු පන්ති ව්‍යාපාරය මුහුණ දෙන තවත් ප්‍රපංචයක් තිබෙනවා. එය ප්‍රතිලාභ හා වරප්‍රසාද දේශපාලනයයි. වතුකරයේ මෙම ප්‍රපංචය වෘත්තීය සමිති ක්ෂේත්‍රයට දේශපාලන දේහයට වැලඳුණු රෝගයක්. එය දැන් රාජ්‍ය අංශයටත් ඇතුල් වෙලා. සහෝදරවරුනි, 1991 දී සමාජවාදී ක්‍රමය බිඳ දැම්මෙන් පසු පොදුවේ ව්‍යාපාරයට බලවත් පසුබෑමක් සිදුවුණා. " ඉතිහාසයේ අවසානය" වශයෙන් සමහර දෘෂ්ඨි විශේෂඥයෝ අනාවැකි පලකලා. ඒ අනාවැකි පල කල අය අද නිහඬයි. මිය ගියා සේ නිහඬයි. තවත් අය වසර 15කට පසු තම ස්ථාවරයෙන් විවෘත ලෙස පසු බැස තිබෙනවා. නව ලිබරල්වාදය තුළින් ප්‍රාතිහාර්ය මවා පෙන්වූ අය දැන් බේදවාචක ගැන කථා කරනවා මූල්‍ය භූමි කම්පා ගැන කතා කරනවා. මූල්‍ය කෙෂත්‍රයෙන් බිම් බෝම්බ හරහා යෑමට සිදුවී තිබෙන බව කියා සිටිනවා.

***සහෝදරවරුනි,***

සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු වෙනස් වූ ලෝක බලතුලනය දැන් යළිත් වරක් වෙනස්වන්නට පටන්ගෙන තිබෙනවා. එය ප්‍රගතිශීලී ව්‍යාපාරයට වාසිවන ආකාරයට වෙනස් වෙමින් තිබෙනවා. එය ඓතිහාසික වශයෙන් එසේ සිදුවිය යුත්තක්. දයලෙක්තිකව එසේ සිදුවිය යුතුය. නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තීන්, තම අභ්‍යන්තර ප්‍රතිවිරෝධතාවය තුළින්ම අර්බුදයකට පත්ව තිබෙනවා. නව ලිබරල් ආර්ථික ආකෘතිය තුළ ලිහිල්කරණය, පෞද්ගලිකරණය, මූල්‍යකරණය තුළින් නව ලෝකයක් බිහිකර තිබෙනවා. රැකියා නැති වර්ධනයක්, දරිද්‍රතාවය, විරැකියාව, මන්දපෝෂණය, සමාජ සේවා කප්පාදුව, විවිධ ලෙඩ රෝග, ජනවාර්ගික ගැටුම්, ආගමික ගැටුම්. බෙදුම්වාදී ප්‍රවනතා, ත්‍රස්තවාදය, පාතාල ලෝකය, ස්වභාවික මෙන්ම මිනිසා විසින්ම නිර්මාණය කළ ආපදා දැකිය හැකිය.

විද්‍යාවේ හා තාක්ෂණයේ වේගවත් දියුණුවක් සිදුවුවද, දේශපාලන වශයෙන් අස්ථාවර, ආර්ථික වශයෙන් අර්බුදකාරී, සදාචාරාත්මකව අනාරක්ෂිත ලෝකයක් නිර්මාණයවී තිබෙනවා. මෙය නව ලිබරල් වාදයේ අර්බුදයයි.

මේ අභියෝගයන්ට ප්‍රතිචාරයක් වශයෙන්, නව සහ අළුත් ආර්ථික ආකෘති විකල්ප ආකෘති වශයෙන් මතුවී තිබෙනවා. ජනතා ව්‍යාපාර තුළින් ඒවා ඉදිරියට ගෙන එනවා.

බහුදැව ලෝකයක් නිර්මාණය වෙමින් තිබෙනවා. ඒ අනුව ලෝක බලතුලනය ද වෙනස් වෙනවා. නව ආර්ථික මධ්‍යස්ථාන මතුවෙනවා.

ලතින් ඇමරිකාව, නව ලිබරල් වාදය පර්යේෂණයට ලක් කළ, පළමු අත්හදා බැලීමක් කළ මහාද්වීපයයි. ආක්‍රමණශීලී, ප්‍රහාරාත්මක ලෙස, තියුණු ලෙස, නව ලිබරල්වාදය ව්‍යාප්ත කළ මහාද්වීපයයි. දැන් එම මහාද්වීපයේ රටවල් 13ක පමණ ප්‍රගතිශීලී - වමට බර - වමේ ආණ්ඩු ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පැමිණ තිබෙනවා. ඒවායේ විවිධ විකල්ප ආර්ථික ආකෘති මතුවෙමින් තිබෙනවා. මේ තුළින් ලතින් ඇමරිකාවේ සිතියම ගුණාත්මක වශයෙන් වෙනස් වී තිබෙනවා. එහි, මානව සහ භෞතික සම්පත් ඒකරාශී කරමින්, ආර්ථික ඒකාග්‍රතාවයක් ඇති කරලීමට සාමූහික ප්‍රයත්නයක් දරනවා. නොබෝදා සෙලැක් (CELAC) නමින් ලතින් අමෙරිකානු රටවල් 33 ක් එක සංවිධානයට පැමිණියා. කියුබාවේ "සීනි" අර්ථිකය දැන් " දැනුම්" ආර්ථිකයක් බවට පත්ව තිබෙනවා. මෙය අපට ධෛර්යයක් - ආශ්වාදයක්. මේ රටවල ජාතිවාදී, බෙදුම්වාදී, මූලධර්මවාදී, ප්‍රවනතාවලට ඉඩක් නැහැ. ජාතිවාදය කරපින්නාගෙන රතු කොඩි ඉහළින් ඔසවා ගෙන යන අපේ රටේ සමහර අයට ලතින් ඇමෙරිකාවේ වමේ ව්‍යාපාරය කදිම ආදර්ශයක්. සමාජවාදයේ මූල ධර්ම ගැන යළිත් සොයා යෑමට ඔවුනට කදිම අවස්ථාවක්.

ලතින් ඇමරිකාවේ, "දකුණේ බැංකුව" (Bank of the South) වශයෙන් නව බැංකුවක් පිහිටුවා තිබෙනවා. වෙනිසියුලාව, ආර්ජෙන්ටිනාව, බ්‍රසීලය, බොලීවියාව, ඉක්වදෝරය සහ පැරගුවේ යන රටවල් මෙම නව බැංකුව ආරම්භ කළා. ප්‍රාග් ධනයේ අයිතිය මත නොව, රටවල අවශ්‍යතාවය මත මෙම බැංකුව ස්ථාපිත කරනු ලැබ ඇත. දේශපාලන බලයක් හෝ මූල්‍ය බලයන් මත පදනම් වූ බැංකුවක් නොවේ. මීට සමාන්තරව "ඇල්බා බැංකුව" (Bank of the Alba) වශයෙන් තවත් බැංකුවක් ස්ථාපිත කොට තිබෙනවා. එය ආර්ථික ඒකාග්‍රතාවය සඳහාවූ බැංකුවයි. එය ලොවේ අනාගත ජාත්‍යන්තර මූල්‍ය සංවිධානය විය හැකිය. එය ලෝක බැංකුවේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්තිවලට හරස්වන්නා වූ බැංකුවකි. මේ සංවර්ධන ප්‍රවනතාවයට ආසියාවේ ආර්ථික යෝධයින්ගේ දැවැන්ත නැගී සිටීම බෙහෙවින් ආධාරකාරී වී තිබේ. "බ්‍රික්ස්" (BRICS) නම් නව සහයෝගිතා සංවිධානයක් බිහිවී තිබෙනවා. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව චීනය සහ දකුණු අප්‍රිකාව ඇතුළුව මෙම සංවිධානය බටහිර ආධිපත්‍යයට අභියෝගයක් එල්ල කොට තිබෙනවා. ලොවේ ජනගහනයෙන් සියයට 40ක් ජීවත් වන්නේ මෙම සංවිධානය තුළයි.

"ෂැන්හයිකෝපරරේෂන්" නම් වූ තවත් සංවිධානයකි. රුසියාව, චීනය, මධ්‍යම ආසියාවේ උෂ්බෙකිස්ථානය, කෂකස්ථානය, ටජිකිස්ථානය සහ කිරිගිස්ථානය මීට ඇතුළත්. දැන් ඉන්දියාව ඊට ඇතුල්වන්නට යනවා. මෙය තවත් සාධනීය වර්ධනයක්. ලෝකය සංවිධානත්මකව වෙනස් වන හැටි මෙයින් දැක ගත හැකියි.

***<u>සහෝදරවරුනි,</u>***

ලොවේ ජනගහනයෙන් සියයට 40 ක් අද ජීවත්වන්නේ කොමියුනිස්ට් පක්ෂ බලයේ සිටින හා බලයට හවුල්කාරී වී සිටින රටවලයි. තවත් එමේ ආණ්ඩු බලයට පත්වී තිබෙනවා. ලොවේ ජනගහනයෙන් අඩක්ම සමාජවාදය දීර්ඝකාලීන විකල්පයක් වශයෙන් තෝරාගෙන තිබෙනවා. සමාජවාදය අතීතියට අයිති දෙයක් නොව, මානව වර්ගයාගේ අනාගතයයි.

චීන කොමියුනිස්ට් පක්ෂය ගතවූ වසර 30 තුළ එනම් 1978 සිට නවීකරණයේ බලවේගයක් බවට පත්වී තිබෙනවා. එවැනි ක්‍රියාදාමයන් වියට්නාමයෙත් සිදුවෙනවා. දැන් ලාඕසයේත් සිදුවන්නට පටන් ගෙන තිබෙනවා. චීනය ගත වූ වසර 30 තුළ මිලියන 680 ක ජනතාවක් දරිද්‍රතාවයෙන් මුදාගෙන තිබෙනවා. සියයට 86 ක් වූ දරිද්‍රතාවය සියයට 10 දක්වා අඩු කොට තිබෙනවා.
අපේ අසල්වැසි නේපාලය (බුදුන් උපන් රට) දකුණු ආසියානු කලාපයේ වඩාත්ම පසුගාමී රටයි. එහි තිබූ ලොවේ එකම හින්දු රාජාණ්ඩුව වෙනුවට නව ජනරජයක් බිහිවී තිබෙනවා. එහි කොමියුනිස්ට් පක්ෂ දෙක රටේ ප්‍රධාන බලවේගය බවට පත්වී තිබෙනවා. ඔවුන් අතර දෘෂ්ඨීමය වශයෙන් වෙනසක් තිබුණද, නව ප්‍රගතිශීලී ආණ්ඩුවක් පිහිටුවීමට එකඟවී තිබෙනවා. අළුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවක් සම්පාදනය කරනවා. එය නිර්ආගමික (Secular) ප්‍රජාතන්ත්‍රවාදී, සංඝීය, භෞමික වශයෙන් අඛණ්ඩ, ඒකාග්‍රතාවයන් යුත් ආණ්ඩු ක්‍රමයක් සම්පාදනය කරනු ලබනවා. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන කමිටුවේ සභාපති වශයෙන් ක්‍රියා කළේ අද අප සංවත්සරයට සහභාගී වන මාධව කුමාර් නේපාල් සහෝදරයායි.

***<u>සහෝදරවරුනි,</u>***

මේ වසර වන විට අපේ රටේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියට වසර 35 කි. 1977 න් එම ප්‍රතිපත්තීන් වැළඳ ගත් අපේ රටට ද අහිතකර, හානිකර ආර්ථික ප්‍රවණතාවලට මුහුණ දීමට සිදුවී තිබෙනවා. ස්වභාවික ආපදාවයන්ට අමතරව, වාර්ගික යුද්ධයට ද මුහුණ දීමට සිදු වුණා.

අප ඉන් යම් ප්‍රමාණයකින් දුරස්ථ වී තිබුණ ද එම රාමුව තුළයි අපට ක්‍රියාත්මක වීමට සිදු වී තිබෙන්නේ. අද දකින සමාජ අර්බුදයට හේතුව එයයි.

අද අපි ජීවත්වන විසි එක්වන ශතවර්ෂය තුළ, කොතෙක් ජයග්‍රහණ ලබා තිබුණ ද, අප වඩාත් සංකීර්ණ ප්‍රශ්න වලට මුහුණ පාමින් සිටිමු. අධිරාජ්‍යවාදය, ස්වභාවික සම්පත් සූරා කෑමත්, කෲරකමත් ලෝක ජනතාව පාලනය කිරීමේ යෙදී සිටිති. ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතීන් සහ නිදහසට මුවාවී ලොව පුරා යුද ආක්‍රමණ දියත් කරමින් රටවල් බෙදා වෙන් කරමින් සිටී.

**ජාතික වශයෙන් අප හමුවේ ප්‍රධාන අභියෝග සතරක් තිබෙනවා.**

***<u>පළමුව :</u>*** **ජාතික ප්‍රශ්නය**

යුද්ධය නිමාවට පත්වීමෙන් පසු ඉතිහාසය විසින් අපට යළිත් අවස්ථාවක් ලබා දී තිබෙනවා, මේ ප්‍රශ්නයට විසඳුමක් සෙවීමට. මේ සඳහා අප ගත යුත්තේ හැඟීම්වලට වහල් නොවූ බුද්ධිමත් ප්‍රවේශයක්. අප අපේ රටේ ඉතිහාසයෙනුත්, අන් රටවල ඉතිහාසයෙනුත් පාඩම් උගත යුතුයි. සුළුතරය වශයෙන් සලකනු ලබන ජනතාවට, අභිමානයක්, ආත්ම ගෞරවයක් සහ අනන්‍යතාවක් තිබෙන අප වටහා ගත යුතුය. අපට වැරදුනු තැන, භාෂා ප්‍රශ්නයෙන් උගත හැකිය. දමිළ භාෂ්ව රාජ්‍ය භාෂාව කිරීමට විරුද්ධ වූ අප වසර 30කට පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ම දමිළ බස රාජ්‍ය භාෂාව බවට පත් කළා. එය ක්‍රියාත්මක වන්න පටන් ගත්තේ මේ මෑතක සිටය. එය සිදු වන්නේ තවත් වසර 20කට පසුවයි. දැන් සියලු පක්ෂ දමිළ භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගන්නවා. එදා පිළිගත්තේ නැහැ. ඒ නිසා සිදු වී විනාශය කොතරම්ද?

බලය බෙදීම ගැන තිබෙන්නේත් එවැනි හුඹස් බියක්. සිතින් මවාගත් බියක්. එසේ නම් ඡන්ද පදනම නැතිවේ යැයි යන පදනම් විරහිත බියක්. ජාතික ප්‍රශණාවලදී අප ජනතාවට නායකත්වය දිය යුතුයි. සමාජ චින්තනය සැපයිය යුත්තේ නායකයින්. අධිෂ්ඨානයත්, කැපවීමත්, නොසැලෙන නායකත්වයත් ඊට අවශ්‍යයි. මෙහිදී අප නෙල්සන් මැන්ඩෙලාගෙන් පාඩම් උගත යුතුයි.

## *දෙවනුව :* නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාව

අප වසර 25 ක් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද වසර 6 ක් පළමුවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ද අවුරුදු 35 ක් ජේ.ආර්.ගේ ව්‍යවස්ථාව යටතේ ද ජීවත් වූවා. ආපසු හැරී බැලූ විට නිදහසින් පසු, 1978 න් පසු තරම් අවුල් වියවුල් තිබූ කාලයක් ඉන් පෙර තිබූ ව්‍යවස්ථාව යටතේ තිබුණේ නැහැ. ඒ ඉංග්‍රීසි-ප්‍රංශ-අමෙරිකානු ව්‍යවස්ථාවල සංකලනයේ ප්‍රතිඵලයක්. නව ලිබරල්වාදය ස්ථාපිත කිරීමට ගෙන ආ ව්‍යවස්ථාව, හැම ක්ෂේත්‍රයක ම අර්බුද ඇතිකරලා තිබෙනවා. සියලු පක්ෂ එකතු වී අප අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කළ යුතුය.

## *තුන් වෙනුව :* ආර්ථික ක්ෂේත්‍රය තුළ

අප ඉකුත් වසර 07 තුළ වේගවත් ආර්ථික වර්ධනයක් සිදු කොට තිබෙනවා. එහෙත් එම සංවර්ධනය තුළින් ම සමාජ අර්බුදයත් නිර්මාණය වෙමින් තිබෙනවා. මෙය අප විසින් කළමනාකරණය කළ යුතුයි. ඒ සඳහා වූ සංකල්පමය, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම අවශ්‍යයි. ආර්ථික වර්ධනය ජනතාවගේ ජීවිත තුළින් පිළිබිඹු විය යුතුයි. මහා භාණ්ඩාගාරය තුළින් පිළිබිඹු විය යුතුයි මේ දෙකම සිදු වන්නේදැයි ප්‍රශ්නයකි. ඇති නැති පරතරය පුළුල්වීම, නව ලිබරල්වාදයේ ගති ලක්ෂණයකි. කදිම නිදසුන, නව ලිබරල්වාදය පළමුවෙන් ම ස්ථාපිත කළ චිලී රාජ්‍යයයි.

## *සතර වෙනුව :* අපේ ජාත්‍යන්තර සබඳතා

අප සියලු රටවල ජනතාව සමග මිත්‍ර සබඳතා තබාගත යුතුයි. එසේ වුව ද ලෝක රටාව, ලෝක බල තුලනය පිළිබඳව යථාර්ථය තේරුම්ගත යුතුයි. විවිධ රටවල ගෝලීය උපාය මාර්ග මෙන් ම භූ දේශපාලනික අවශ්‍යතා තේරුම්ගත යුතුයි. අපේ අභ්‍යන්තර ප්‍රශ්න අප විසින්ම විසඳාගත හොත් කිසිදු රටකට අපේ කටයුතුවලට ඇඟිලි ගැසීමට කොන්දේසි ඇති නොවෙනු ඇති. අපේ ජාතික ශක්තිය නංවාලීම අවශ්‍ය වන්නේය. ජාත්‍යන්තර කීර්තිය ද නංවාලිය යුතුය.

අපේ පක්ෂයේ 70 වෙනි සංවත්සරයේ දී ජනතාව වෙත අප දෙන පණිවුඩය එයයි. අපේ ආරාධනය පරිදි ඊට සහභාගී වූ ඔබ සැමට අපේ ස්තූතිය හා සුබ පැතුම්.